# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2130/5 - 2019 ජූලි මස 01 වැනි සඳුදා - 2019.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : - IR/13/02/2013

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.01.12 දිනැති හා අංක 1949/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.12.31 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බලපිටිය, වැලිතර, ගුරු නිවාස පාර හි පදිංචි ආර්. අනුරුද්ධ මාවැලි මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංක ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.05.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සී. එන්. විතානාච්චි,
කම්කරු කොමසාරිස් ජනරාල් (රාජකාරි ආවරණය),
කම්කරු කොමසාරිස් ජනරාල් වෙනුවට

2019 ජුනි මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

ආර්. අනුරුද්ධ මාවැලි මයා,
ගුරු නිවාස පාර,
වැලිතර,
බලපිටිය.

සහ

නඩු අංකය : ඒ 3617 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක : 200, කිරුළ පාර,
කොළඹ 05,

*අතර පවත්නා කාර්මික ආරාවුල.*

ප්‍රදානයයි.

ඉහත පාර්ශ්වයන් අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් කම්කරු හා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අමාත්‍යවරයා එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2015.12.31 වන දින මා වෙත යොමු කරන ලදී.

මෙම නඩුවට ගොනුකර ඇති කම්කරු කොමසාරිස්වරයාගේ අංක IR/13/2/2013 දරන ලේඛනය අනුව මෙම කාර්මික ආරවුලට හේතුවී පවත්නා කරුණ වන්නේ.

''ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ අම්බලන්ගොඩ ඩිපෝවේ කාර්මිකයෙකු ලෙස සේවය කළ ආර්. අනුරුද්ධ මාවැලි මහතා හට 2009.05.15 දින සේවා ස්ථානයේ ඇතිවූ සිදුවීමක් මත චෝදනා නගා විනය පරීක්ෂණයක් පවත්වා ලබා දී ඇති දඬුවම් යුක්ති සහගතද? යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට ලබා දිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ''

ඉල්ලුම්කරු 2016.02.08 වන දින මෙම අධිකරණයට ඉදිරිපත් කර ඇති ඉල්ලීමේ සඳහන් වන්නේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අම්බලන්ගොඩ ඩිපෝවේ කාර්මිකයෙකු ලෙස සේවය කරමින් සිටියදී 2009.05.15 වන දින වැටුප් පිළිබඳ සිද්ධියක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු ඇතුළු සේවකයින් 10 දෙනෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ගන්නා ලද බවයි. තමාට එරෙහිව චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර විනය පරීක්ෂණයක් පවත්වා

1A– G 30423 — 24 (2019/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

දඬුවමක් වශයෙන් මාස හයක සේවා තහනමක් හා ස්ථාන මාරුවක් ලබාදුන් බව ඉල්ලුම්කරු සිය ඉල්ලීමේ සඳහන් කර ඇත. ඉල්ලුම්කරු වැඩිදුරටත් එහි සඳහන් කර ඇත්තේ තමා ලංකා ප්‍රවාහන සේවක සංගමයේ අම්බලන්ගොඩ ශාඛාවේ ලේකම් ලෙස කටයුතු කරන ලද බවත් අදාළ සිද්ධිය වූ අවස්ථාවේ තමා සේවය කරන කාර්මික අංශයේ බස් රථයක සේවා කටයුතු සිදු කරමින් සිටි බවත් තමාට දඬුවම් කිරීම ද්වේශ සහගතව හා පළිගැනීමේ චේතනාවෙන් සිදුකර ඇති බවත් ය. සේවය තහනම් කර තිබූ කාලයේ වැටුපද ඉල්ලුම්කරු අපහසුතාවයට පත් කිරීම සම්බන්ධයෙන් වන්දියක් ද ලබාදෙන ලෙස මෙම අධිකරණයෙන් ඉල්ලා ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2016.02.23 වන දින ඉදිරිපත් කර ඇති පිළිතුරු ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු අම්බලන්ගොඩ ඩිපෝවේ මෝටර් කාර්මිකයෙකු ලෙස සේවය කරමින් සිටියදී 2009.05.15 වන දින එම කාර්යාල පිවිසුම ඇතුලු ගිණුම් කාර්යාලවල පිවිසුම් දෙරටුවල ඉබි යතුරු දමා සහකාර කළමනාකරු ඇතුලු කාර්යය මණ්ඩලය බලහත්කාරයෙන් රඳවා තැබීමට ටී. උපුල් නැමති සේවකයා විසින් කරන ලද අවිධිමත් ක්‍රියාවලියට සක්‍රීය ලෙස සහයෝගය ලබාදීමෙන් බරපතල විෂමාචාරයක් සිදු කිරීම ඇතුළු චෝදනා කිහිපයක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර විනය පරීක්ෂණයක් පවත්වන ලද බවත් 2010.10.18 දිනැති විනය නියෝගය මගින් මාස හයක සේවා අත්හිටුවීමක් හා අලුත්ගම ඩිපෝවට ස්ථාන මාරු කිරීම යන දඬුවම් දෙක ලබාදුන් බවත් ය. එම දඬුවම් ලබාදෙන ලද්දේ අභියාචනයක් කිරීමට යටත්ව බවත් ඉල්ලුම්කරු අභියාචනය කිරීමෙන් පසු 2012.06.21 වන දින දරන අභියාචනා නියෝගය අනුව විනය විභාගයේ දඬුවම් එලෙසම ක්‍රියාත්මක කරන ලද බවය. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විනය ව්‍යවස්ථාවට අනුව ඉල්ලුම්කරු විනය කඩකර ඇති බව ඔප්පුවී ඇති නිසා විනය නියෝගය හා අභියාචන නියෝගය මගින් ඉල්ලුම්කරුට දඬුවම් පනවා ඇති බවත් ඒ නිසා ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලෙසත් වගඋත්තරකාර පාර්ශ්වය පිළිතුරු ප්‍රකාශය මගින් ඉල්ලා ඇත.

ඉල්ලුම්කරු 2016.10.25 වන දින ප්‍රතිඋත්තර ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ චෝදනාවට ලක්වූ සිද්ධිය වන අවස්ථාවේ ඔහු සිය සේවා අංශයේ බස් රථයක ආපදාවක් සකස් කරමින් සිටි බවයි. ඒ බව සනාථ කිරීම සඳහා එදින ඔහු වෙත ලැබී තිබූ වැඩ ඇමුණුමේ පිටපතක්ද ප්‍රතිඋත්තරය සමග ගොනු කර ඇත. තවද ඉල්ලුම්කරු සඳහන් කර ඇත්තේ මෙම සිද්ධියේ ප්‍රධාන වගඋත්තරකරු වූ ටී. උපුල් නැමති සේවකයාට එරෙහිව පැවති විනය විභාගයෙන් පසු මණ්ඩලය ඔහු රැකියාවෙන් නෙරපා හරින ලද නමුත් පසුව ඔහුට දුන් දඬුවම ඉවත් කර පෙර තනතුරේ සහ පෙර සේවා ස්ථානයේ රැකියාව ලබාදුන් බවය.

දෙපාර්ශ්වය අතර ඇතිවී තිබූ ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීමට නොහැකි තත්වයක් පැවති හෙයින් විභාගයට ගෙන 2017.04.28 වන දින ඉල්ලුම්කරුගෙන් සාක්ෂි ලබා ගන්නා ලදී. ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් අම්බලන්ගොඩ ඩිපෝවේ සේවය කරමින් සිටියදි 2009.05.15 වන දින වැටුප් ප්‍රශ්නයක් මත සේවක උද්සෝෂණයක් පැවති බවත්, එම උද්සෝෂණයෙන් පසු ඉල්ලුම්කරුට චෝදනා පහකින් යුත් චෝදනා පත්‍රයක් ලබාදුන් බවත් ප්‍රකාශ කළේය. එකී චෝදනා පත්‍රය ඒ 1 ලෙස ලකුණු කර ඉදිරිපත් කළ අතර එම සිද්ධිය සිදුවන අවස්ථාවේ ඉල්ලුම්කරු බස් රථයක ආපදාවක් සකස් කරමින් සිටි බව සනාථ කිරීම සඳහා ඔහුට ලැබුණු වැඩ ඇමුණුම ඒ 2 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී ඔහුට ලබාදුන් විනය නියෝගය ඒ 3 ලෙසත්, විනය නියෝගය අනුව ස්ථාන මාරු කිරීමේ නියෝගය ඒ 4 ලෙසත් අභියාචනා නියෝගය ඒ 5 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ උද්සෝෂණය මෙහෙයවූ උපුල් නැමති සේවකයා විනය නියෝගයකින් පසුව සේවයෙන් පහ කලද පසුව ගමනාගමන මණ්ඩලය ඔහුට රැකියාව ලබාදීමට පියවර ගත් බවය. ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී ටී. උපුල් නැමති සේවකයා සම්බන්ධයෙන් දී ඇති කම්කරු විනිශ්චය සභා නියෝගය ඒ 6 ලෙසද, ඉල්ලුම්කරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස ගැසට් කරන ලද ගැසට් පත්‍රය ඒ 7 ලෙසද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරු ඉල්ලා සිටියේ සේවා තහනමට ලක් කර සිටි කාලයේ වැටුප්ද පෙර සේවා ස්ථානයට ස්ථාන මාරුවක්ද ලබාදෙන ලෙසය.

ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී ඉල්ලුම්කරුගේ පත්වීම් ලිපිය ආර් 1 ලෙස ලකුණු කරන ලද අතර ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර කිරීමේ ලිපිය ආර්. 2 ලෙසත් ඉල්ලුම්කරු අම්බලන්ගොඩ ඩිපෝවට මාරු කිරීමේ ලිපිය ආර් 3 ලෙසත් ලකුණු කරන ලදී. ඉල්ලුම්කරු මූලික සාක්ෂි දෙන අවස්ථාවේ දී ඒ 1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රය පෙන්වමින් ප්‍රශ්න කළ අවස්ථාවේ දී එකී චෝදනා පත්‍රය තමන් වෙත ලැබුණු චෝදනා පත්‍රය බව පිළිගත්තේ ය. සිද්ධිය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගෙන් අසන ලද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ "උදේ හතට විතර ඩී. එස්. මහත්තය හිටියෙ නැහැ. වැඩ බලන කෙනෙක් තමයි හිටියෙ. වෘත්තිය සමිති නායකයන්ට එන්න කියලා පණිවිඩයක් එවලා තිබුණා. මා ලංකා ගමනා ගමන මණ්ඩලය නියෝජනය කරන සමස්ථ ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ශාඛා ලේකම් හැටියට එම පණිවිඩය ලැබුණා. ඉන් පසුව මා භාරව හිටින වැඩ මූලික ඒ කියන්නේ මා භාරව සිටි නිලධාරින් දැනුවත් කළා මට වැඩ බලන ඩිපෝ කළමනාකාර අංශයෙන් පිටතට එන ලෙසට. ඔහුගේ අවසරය මත මා ඩිපෝ කළමනාකරු මුණ ගැහෙන්න ගියා වැටුප් සාකච්ඡා කරන්න. (2017.09.15 වන දින සාක්ෂි සටහන් පිටු 12, 13)

වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ලිපිකරු ටී. වී. ඉන්දික සහ කළමනාකරුවෙකු වන රංජිත්ද සිල්වා ද සාක්ෂියට කැඳවන ලදී. ටී. වී. ඉන්දික නැමති අය ඉල්ලුම්කරුගේ පුද්ගලික ලිපි ගොනුව ඉදිරිපත් කරමින් සාක්ෂි දෙමින් ඉල්ලුම්කරුට 2009.05.15 දින සිද්ධිය සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් ලබාදී විනය විභාගයක් පවත්වන ලද බවත් විනය විභාගයෙන් ඉල්ලුම්කරු චෝදනා සියල්ලටම වැරදිකරු කර දඬුවම් ලබාදී ඇති බවත් ප්‍රකාශ කළේය. ඉල්ලුම්කරු වෙනුවෙන් ඔහුගේ හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවේ 6.1 (ඒ8 ලේඛණය) අනුව බරපතල විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් චෝදනාවකට ලක්වී සේවය තහනම් කළවිට කළ යුතු වන්නේ අර්ධ වශයෙන් වේතනය අත්හිටුවීමක් නේදැයි විමසා සිටින ලදී.

ඉල්ලුම්කරු හරස් ප්‍රශ්නවලට දුන් පිළිතුරු වලින් රංජිත් ද සිල්වා නැමති අය දුන් සාක්ෂියෙන් ද ඒ 7 ලෙස සලකුණු කරන ලොග් සටහන්වලින්ද පැහැදිලි වන්නේ අදාළ සිද්ධිය සිදුවූ

අවස්ථාවේ ඉල්ලුම්කරු තවත් අය සමග උද්ඝෝෂණය පැවති ස්ථානයේ රැඳී සිටින ලද අය බවයි. කෙසේ වුවද ඉල්ලුම්කරු තවත් අය සමග එහි රැඳී සිටිනවා දුටු නමුත් ඔහු දුරකථන හෝ විදුලිය විසන්ධි කරනවා දුටුවේ නැති බව හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් රංජිත් සිල්වා නැමති අය ප්‍රකාශ කළේ ය.

සිද්ධිය වූ දින කළමනාකරුවන් ඇතුළු කාර්යය මණ්ඩලය බලහත්කාරයෙන් රඳවා තැබීම මෙහෙයවා ඇත්තේ ටී. උපුල් නැමති රියදුරු විසින් බව ගමනාගමන මණ්ඩලයද පිළිගන්නා ලද කරුණකි. මෙම ඉල්ලුම්කරුට ලබාදී ඇති චෝදනා පත්‍රයේ සඳහන් වන්නේ කාර්යාලයේ පිවිසුම ඇතුළු ගිණුම් කාර්යාල පිවිසුම් දෙරවල් වල ඉබි යතුරු දමා අම්බලන්ගොඩ ඩිපෝවේ කළමනාකරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය බලහත්කාරයෙන් කාමරයේ හා රඳවා ගැනීමට ටී. උපුල් නැමති අය විසින් මෙහෙයවන ලද අවිධිමත් ක්‍රියාවලිය වෙනුවෙන් සක්‍රිය ලෙස සහයෝගය ලබාදීමෙන් බරපතල විෂමාචාරයක් සිදු කරන ලද බවයි. ඉදිරිපත්ව ඇති සාක්ෂි හා ලේඛණ අනුව පෙනී යන්නේ ටී. උපුල් යන අයට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා ඔහු සේවයෙන් ඉවත් කර ඇති බවයි. ඉල්ලුම්කරු ඇතුළු තවත් සේවකයින් කිහිපදෙනෙකුට චෝදනා පත්‍ර ඉදිරිපත් කර ඇති අතර ඉල්ලුම්කරු හැර අනෙක් සේවකයින්ට ලබාදුන් දඬුවම් කුමක් ද යන්න පිළිබඳ තොරතුරු අනාවරණය වූයේ නැත. විනය විභාගයෙන් පසු 2010.10.18 දිනැති විනය නියෝගය අනුව ඉල්ලුම්කරුට දී ඇති දඬුවම් වන්නේ

1. ඉදිරියට මාස හයකට (06) සේවය තාවකාලිකව අත්හිටුවීම
2. ශ්‍රී ලංගම අලුත්ගම ඩිපෝවට ස්ථාන මාරු කිරීම.

විනය නියෝගයේ සඳහන් වන්නේ එම විනය නියෝගයට එකඟ නොවන්නේ නම් එක් මසක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කරුට අයිතියක් ඇති බවයි. ඒ අනුව ඉල්ලුම්කරු නියමිත කාලය ඇතුළත අභියාචනයක් කර ඇති බව ලේඛණ වලින් තහවුරු වේ. කෙසේ වුවද ඉදිරිපත් වී ඇති ලේඛණ වලින් පැහැදිලි වන්නේ අභියාචනය විභාග කර නියෝගය ලබාදීමට පෙර ඉල්ලුම්කරුට දී ඇති දඬුවම් දෙකෙන් එකක් ක්‍රියාත්මක කර ඇති බවය. එනම් ඉල්ලුම්කරු 2010.10.29 දින සිට අලුත්ගම ඩිපෝවට මාරුවක් ලබාදී ඇති බවයි.

| | |
|---|---|
| විනය නියෝගය දුන් දිනය | 2010.10.18 |
| ස්ථාන මාරුව | 2010.10.29 |
| අභියාචන නියෝගය | 2012.06.29 |

එයින් පැහැදිලි වන්නේ අභියාචනය විමසා තීන්දුවක් ලබාදීමට පෙර විනය නියෝගයෙන් ඉල්ලුම්කරුට දී ඇති දෙවන දඬුවම ක්‍රියාත්මක කර ඇති බවයි. එය යුක්ති සහගත ක්‍රියාවක් නොවන බව පෙනේ. අභියාචනයේදී ඉල්ලුම්කරු ඔහුට එල්ල ඇති චෝදනා වලින් නිදහස් වූයේ නම් එසේ නිදහස් වනවිට ලබා ඇති දඬුවම් වලින් එකක් ක්‍රියාත්මක වී අවසානය. අභියාචනා නියෝගයෙන් පසු ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවීම 2012.07.01 දින සිට 2012.12.31 දිනට බලපවත්වන පරිදි ක්‍රියාත්මක කර ඇත.

ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කළ තවත් කරුණක් වන්නේ සිද්ධිය මෙහෙයවන ලද රියදුරු සේවයෙන් පහ කළද ඔහුට නැවත සේවය ලබාදුන් බවය. එම සේවකයා ගාල්ල කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ පවරා තිබූ එල්. ටී. ජී. 32/2011 දින දරන නියෝගයේ පිටපතක් ඉල්ලුම්කරුගේ සාක්ෂියේදී ඒ6 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලේඛණයෙන් සඳහන් වන්නේ ඉහත කී නඩුව විභාගයට ගත් අවස්ථාවේදී ගමනා ගමන මණ්ඩලය කම්කරු විනිශ්චය සභාවට දන්වා ඇත්තේ ඉල්ලුම්කරු සේවා කඩවීමකින් තොරව කලින් සේවය කළ තනතුරේම නැවත සේවයේ පිහිටුවා ඇති බවත්, එබැවින් එම ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් තවදුරටත් විමසීමක් අවශ්‍ය නොවන බවත්ය. ඒ අනුව ඉල්ලුම්කරු සිය ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස් කරගෙන ඇත. 2012.07.04 දින දරන එම ලේඛණයෙන් පැහැදිලි වන්නේ කළමනාකරුවන් බලහත්කාරයෙන් රඳවා තැබීමේ සිද්ධිය මෙහෙයවන ලද ටී. උපුල් නැමති සේවකයා සම්බන්ධයෙන් ඒ වනවිට ගමනාගමන මණ්ඩලය ලිහිල් පිළිවෙතක් අනුගමනය කර ඇති බවය. එවැනි තත්වයක් යටතේ මෙම ඉල්ලුම්කරුට එරෙහිව දී ඇති අභියාචන නියෝගය ප්‍රකාරව ඉල්ලුම්කරු 2012.07.01 දින සිට මාස හයක් සේවය අත් හිටුවීමට ක්‍රියා කිරීම අසාධාරණ බව පෙනේ. තවද මෙම නඩුව විභාග කරන අතරතුර සමථයක් පිළිබඳ යෝජනා ඉදිරිපත් වු අතර සමථය පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා ඒ බව අධිකරණයට දැනුම් දෙන බව ප්‍රකාශ කළද ඒ පිළිබඳව ගමනාගමන මණ්ඩලය උනන්දුවකින් කටයුතු නොකළ බව පෙනී යයි.

මා විසින් බැලිය යුතු කරුණ වන්නේ ඉල්ලුම්කරුට දී ඇති දඬුවම යුක්ති සහගතද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට ලබාදිය යුතු සහනයන් කවරේද යන්නයි. ඉහතින් සඳහන් කළ ආකාරයට සිද්ධිය මෙහෙයවන ලද ටී. උපුල් නැමති සේවකයාට ලබාදී ඇති දඬුවම ඉවත් කිරීමට පියවරගෙන තිබීමද, ඉල්ලුම්කරුට දී ඇති එක් දඬුවමක් එනම් ස්ථාන මාරුව ක්‍රියාත්මක කර තිබීමද යන කාරණා දෙක පිළිබඳව අවධානය යොමු කළෙමි.

ඉහත කරුණු සියල්ල සලකා බලනවිට ඉල්ලුම්කරුට එරෙහිව මාස හයක සේවා අත්හිටුවීම සහ ස්ථාන මාරුව යුක්ති සහගත නොවන බව තීරණය කරන අතර ඉල්ලුම්කරුට සේවය අත්හිටුවා සිටි මාස හයක කාලය සඳහා හිඟ වැටුප් ලබාදීම, දඬුවම ක්‍රියාත්මක කරන අවස්ථාවේ සේවය කරන ලද අම්බලන්ගොඩ ඩිපෝවට ස්ථාන මාරුවක් ලබාදීම යන සහන දෙක ප්‍රදානය කිරීමට තීරණය කරමි.

බේරුම්කරු

2019.05.10

07 - 481

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.